**ශීර්ෂය 416 - දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශය**

---

1. මූල්‍ය ප්‍රකාශන

---

1.1 තත්ත්වාගණනය කළ මතය

---

දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**,** එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් අඩංගු සම්පිණ්ඩන වාර්තාව 2022 මැයි 31 දින ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජූලි 20 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට දේශීය වෛදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන හා ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං. වි. ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව රාජ්‍ය අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව, රාජ්‍ය අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1) (ඈ) වගන්තිය ප්‍රකාරව, පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූපවී තිබුණි.

(ආ) මෙම වාර්තාවේ 1.6.1 (ඇ), 1.6.3 (ආ) , (ඇ) ඡේදවල සඳහන් නිරීක්ෂණ සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

----------------------------------------

### 1.6.1 මූලධන වියදම්

----------------

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ මූලධන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු සිදුවී තිබුණු බව නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2021 ජූලි 06 දින මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයෙන් ලැබී තිබුණු පිරිවැය රු.2,767,510 ක් වූ කාර්යාල උපකරණ ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර නොතිබුණු අතර මූල්‍ය නොවන වත්කම් යටතේ ගිණුම්ගත කරද නොතිබුණි. | ලැබී තිබුණු කාර්යාල උපකරණ ගිණුම්ගත කිරීමටත්, ස්ථාවර වත්කම් ලේඛනයට ඇතුළත් කර ගැනීමටත් අවශ්‍ය පියවර ගන්නා බව හා ඊළඟ මාසයේ ගිණුම් සාරාංශ මඟින් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | වරද නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතු අතර ඉදිරියේදී මෙවැනි අඩුපාඩු වළක්වා ගැනීම සඳහා සුදුසු පාලන ක්‍රම ස්ථාපිත කළ යුතුය. |
| (ආ) | 2021 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශ සතු වාහන 29 ක පිරිවැය රු.205,579,850 ක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දක්වා තිබුණු නමුත්, එදිනට අමාත්‍යාංශ සතු වාහන සංඛ්‍යාව 17 ක් බවත්, ඒවායේ පිරිවැය රු.154,225,000 ක් බවත්, කොම්ප්ට්‍රෝලර් ජනරාල් දෙපාර්තමේන්තුව වෙත වාර්තා කර තිබුණි. | වාහන 29 ක් අමාත්‍යාංශය සතුව පැවතියත් ඉන් වාහන 12 ක් සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත ලබාදී ඇති බැවින් කොම්ප්ට්‍රොලර් ජනරාල් වෙත වාර්තා කර ඇත්තේ අමාත්‍යාංශය සතුව භෞතික වශයෙන් පවතින වාහන 17 ට අදාළ පිරිවැය පමණක් වන බව. | අමාත්‍යාංශය සතු සියළු සියළු වත්කම් ගිණුම්ගත කළ යුතු අතර භාවිතා කරන නමුත් පවරා නොගත් වත්කම් අප්‍රමාදව පවරා ගැනීමටද, සෑම විටම ගිණුම්වලින් වත්කම්වල සත්‍ය තත්ත්වයන් නිරූපනය කිරීමටද කටයුතු කළ යුතුය. |
| (ඇ) | ඉකුත් වර්ෂයේ විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු වාහන ලැයිස්තුවේ ඇතුළත්ව තිබුණු ඔසුගොවි ව්‍යාපෘතියට අයත්ව තිබුණු මෝටර් බයිසිකල් 48 ක, අමාත්‍ය කාර්ය මණ්ඩලය පරිහරණය කරන වාහන 06 ක පිරිවැය සමාලෝචිත වර්ෂයේදීද ගිණුම්ගත කර නොතිබුණි. තවද විගණනය සඳහා ඉදිරිපත් කර තිබුණු වාහන ලැයිස්තුව තුළ වාහනවල පිරිවැය සඳහන්ව නොතිබුණි. | ඔසුගොවි ගම්මාන ව්‍යාපෘතිය යටතේ ලබාගෙන ඇති මෝටර් බයිසිකල් ඉදිරි මාස 03 තුළ විධිමත්ව ආයුර්වේද දෙපාර්තමේන්තුවට සහ ආයුර්වේද ඖෂධ සංස්ථාවට ලබාදීමට කටයුතු කරන බව, අමාත්‍ය කාර්ය මණ්ඩලය පරිහරණය කරන වාහන 06 සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගරු අමාත්‍යතුමාට හා අමාත්‍ය කාර්ය මණ්ඩලයට ලබාදී ඇති බව හා ඉදිරියේදී මෙම වාහනවල අයිතිය නිරවුල් කර වාහනවල පිරිවැය | -එම- |

| | | | |
|---|---|---|---|
| | | ගිණුම්ගත කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | |
| (ඇ) | අමාත්‍යාංශය යටතේ පාලනය වන හෝමියෝපති රෝහලේ මූලධන වියදම් සඳහා රු.1,568,360 ක් වැය කර අදාළ වැය විෂයයන්ට හර කර තිබුණි. එසේ වුවද, රෝහලේ නාමපුවරු සඳහා වැය කර තිබුණු රු.144,000 ක් පමණක් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර තිබුණු නමුත් ඉතිරි රු.1,424,360 ක් මූල්‍ය නොවන වත්කම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. | රාජ්‍ය අමාත්‍යාංශයේ මූලධන වැය විෂයට හර කර තිබුණු රු.1,424,360 ක වියදම මූල්‍ය නොවන වත්කමක් ලෙස ඊළඟ මාසයේදී ඇතුළත් කර ගැනීමට කටයුතු කරන බව. | වියදම් නිවැරදිව වර්ගීකරණය කර ගිණුම්ගත කළ යුතු අතර මූල්‍ය නොවන වත්කම්වල වටිනාකම් නිවැරදිව දැක්වීමට කටයුතු කළ යුතුය. |

1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම

---------------------------------------------

අමාත්‍යාංශය විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ---------------------------- | ------------ |
| (අ) | මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව තොග පොත් යාවත්කාලින කර නොතිබුණි. | යාවත්කාලීන කරන බව. | මුදල් රෙගුලාසි 751 හා 763 ප්‍රකාරව තොග පොත් පවත්වා ගත යුතුය. |
| (ආ) | මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානි පිළිබඳ ලේඛනය යාවත්කාලින කර නොතිබුණි. | හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර, නිවැරදිව පවත්වාගෙන යන බව. | මුදල් රෙගුලාසි 110 හි විධිවිධාන ප්‍රකාර ඒ යටතේ වන ආකෘතිය අනුව හානි පිළිබඳ ලේඛනය පවත්වා ගත යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් පිළිබඳ ලේඛනයක් පවත්වා නොතිබුණි. | බැරකම් ලේඛනයක් පවත්වා ගෙන ගොස් නොමැති බව හා ඉදිරියේදි බැරකම් ලේඛනය පවත්වා ගෙනයාමට කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි 214 ප්‍රකාරව බැරකම් නිතිපතා පරීක්ෂා කළ හැකි වන පරිදි බැරකම් ලේඛනයක් පවත්වා ගත යුතුය. |

1.6.3 ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව ගණන්දීමේ නිලධාරී විසින් පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් සහතික වීම් කළ යුතුව තිබුණත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශ |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. | 2018 අංක 19 දරන විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව, අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සම්බන්ධයෙන් අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලදායීතාවය පිළිබඳව කලින් කල සමාලෝචනය කර, ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඇ) වගන්තියේ සහ 38 (2) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නියමිත පරිදි අදාළ වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. |
| (ආ) අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු වුවද, වාර්තාවේ 5.1 ඡේදයේ සඳහන් නිරීක්ෂණ අනුව එම අවශ්‍යතාවය ඉටු කර නොතිබුණි. | 2018 අංක 19 දරන විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන අනුව, අභ්‍යන්තර විගණන කර්තව්‍ය නිසි පරිදි ක්‍රියාත්මක කිරීම සඳහා ඵලදායි ක්‍රමවේදයක් ඇති කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38(1)(ඊ) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැය විෂයයන් 04 කට අදාළ රු.3,650,000 ක්වූ මුළු ප්‍රතිපාදනයම මුදල් රෙගුලාසි 66 යටතේ වෙනත් වැය විෂයන් වෙත මාරු කර ගෙන තිබුණි. | මුදල් රෙගුලාසි 66 ප්‍රකාරව ප්‍රතිපාදන මාරු කර ඇති බව, එමගින් සමස්ථ වැඩසටහනෙහි ශුද්ධ ප්‍රතිපලයේ වෙනසක් සිදු නොවන බව හා ඉදිරියේදි පෙන්වාදී ඇති කරුණු අනුව කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගන්නා බව. | ආයතනයේ දැක්ම හා මෙහෙවර අනුව සකස් කෙරෙන වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් වන ක්‍රියාකාරකම් සැලකිල්ලට ගෙන නිවැරදි හා තාත්වික |

| | | |
|---|---|---|
| | | ඇස්තමේන්තු පිළියෙල කළ යුතුය. |
| (ආ) අමාත්‍ය කාර්යාලයේ පැරණි යන්ත්‍රෝපකරණ නොතිබුණු නමුත් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ නඩත්තු සඳහා රු.850,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු බැවින් ඉන් සියයට 71 ක් හෙවත් රු.600,000 ක් අමාත්‍යවරයාගේ වාහන නඩත්තු වියදම් සඳහා මුදල් රෙගුලාසි 66 යටතේ මාරු කර ගෙන තිබුණි. | -එම- | -එම- |

2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මුදල් රෙගුලාසි 94 (1) හි දැක්වෙන විධිවිධාන වලට පටහැනිව, පුනරාවර්තන වැය විෂයයන් 02 ක රු.103,264 ක් වූ ඉතිරිවීම් ඉක්මවා රු.212,290 ක බැරකම් වලට බැඳී තිබුණි. | 2021 වර්ෂයේ ලබාදුන් ප්‍රතිපාදන බැරකම් නිරවුල් කිරීමට ප්‍රමාණවත් නොවුණු නිසා ප්‍රතිපාදනවල ඉතිරිය ඉක්මවා බැරකම්වලට බැඳීමට සිදුවූ බව හා ඉදිරි වර්ෂයේදී පෙන්වාදී ඇති පරිදි කටයුතු කරන බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය. |
| (ආ) පුනරාවර්තන වැය විෂයයන් 05 කට අදාළ රු.169,833 ක් වූ බැරකම් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමෙන් පසු වැය විෂයන් 05 කට අදාළ වවුචර්පත් ගෙවීම සඳහා ඉදිරිපත් කර ඇති බව හා ඉදිරියේදී මෙවැනි වැරදීම් සිදු නොවීමට අවශ්‍ය අභ්‍යන්තර පාලන ක්‍රම ශක්තිමත් කර අඩුපාඩු අවම කර ගැනීමට කටයුතු කරන බව. | සියළුම බැරකම් පරීක්ෂා කර අදාළ ගිණුම්වලට ඇතුළත් කෙරෙන බවට තහවුරු කර ගැනීමේ අභ්‍යන්තර පාලන ක්‍රම පවත්වා ගත යුතුය. |

2.3 අත්තිකාරම් නිකුත් කිරීම් හා පියවීම්

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සේවය අතහැර ගොස්, වර්ෂ 02 ත් වර්ෂ 03 ත් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.171,975 | සේවය අතහැර ගොස් සිටින නිලධාරීන් දෙදෙනෙකුගේ ණය ශේෂයන් අයකර ගැනීමට ක්‍රියා | අප්‍රමාදව හිඟ ණය ශේෂ පියවා ගැනීම සඳහා කටයුතු කළ යුතුය. |

| | | |
|---|---|---|
| ක්ද, වර්ෂ 03 ත් වර්ෂ 04 ත් අතර කාලයක් ගතවී තිබුණු නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.121,120 ක්ද වශයෙන් වූ එකතුව රු.293,095 ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් අයකර ගැනීමට අපොහොසත්වී තිබුණි. | කරමින් පවතින බව හා මෙම අය දැනට සේවයේ යෙදීම සඳහා අභියාචනයක්ද ඉදිරිපත් කර ඇති බව. | |

2.4 බැංකු ගිණුම් මෙහෙයවීම
---------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.1,901,229 ක්වූ චෙක්පත් 07 ක්, නිකුත්කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොකළ චෙක්පත් ලෙස 2021 දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු බැංකු සැසඳුම් ප්‍රකාශනය තුළ ඇතුළත් කර තිබුණු නමුත් 2022 අප්‍රේල් 08 දින වන විටත් එම චෙක්පත් නිකුත් නොකර අත රඳවා ගෙන තිබුණි. | 2021 දෙසැම්බර් 31 දිනට පෙර නිකුත් කර 2022 අප්‍රේල් 08 දින වන විට ගෙවීම සඳහා ඉදිරිපත් නොවූ චෙක්පත්වල එකතු වටිනාකම රු.1,625,747 ක් වන බව හා 2022 මැයි 25 දින වන විට ඒ සඳහා ක්‍රියාමාර්ග ගෙන ඇති බව. | චෙක්පත් නිකුත් නොකර අත රඳවා නොගෙන අප්‍රමාදව ආදායකයා වෙත යැවිය යුතුය. චෙක්පත් භාවිතය සම්බන්ධයෙන් අදාළ නීති රීති සහ රෙගුලාසි අනුව කටයුතු කළ යුතුය. |

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම
-------------------------------

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ආයුර්වේද ඖෂධ සංස්ථාව තුළ ඩීසල් විදුලි ජනක යන්ත්‍රයක් හා නව විදුලි බෙදාහැරීමේ පද්ධතියක් ස්ථාපනය කිරීම සඳහා 2020 හා 2021 වර්ෂවලදී පිළිවෙලින් රු.5,000,000 ක් හා රු.23,500,000 ක් රාජ්‍ය අමාත්‍යාංශය විසින් එම සංස්ථාවට ලබාදී තිබුණු නමුත් 2022 අප්‍රේල් 30 දින වන විටත් සංස්ථාව විසින් අදාළ මුදල් උපයෝජනය නොකර ස්ථාවර තැන්පතුවක තැන්පත් කර තිබුණි. | විදුලි ජනක යන්ත්‍රය මිලදී ගැනීම සඳහා 2021 දී සැපයුම්කරුවෙකු තෝරා ගෙන ප්‍රසම්පාදනය පිරිනමා අදාල ණයවර ලිපිය විවෘත කළ නමුත් සැපයුම්කරු විසින් විදුලි ජනක යන්ත්‍රය සැපයීම නොකළ බව, නැවත වතාවක් 2022 වර්ෂයේදී ප්‍රසම්පාදන කටයුතු ආරම්භ කර ඉදිරි කටයුතු සිදුකර ගෙන යන බව හා ඉදිරියේදී ප්‍රගතිය සමාලෝචනය කරමින් කටයුතු කරන බව. | අමාත්‍යාංශය යටතේ පවතින ආයතන සඳහා ලබාදෙන ප්‍රතිපාදන උපයෝජනය සහ එහි ඵලදායිතාවය සම්බන්ධයෙන් ප්‍රමාණවත් පසු විපරම් ක්‍රියාවලියක් අනුගමනය කළ යුතුය. |

3.2 කළමනාකරණ දුර්වලතා

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරිගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකාව පුරා ආරණ්‍ය 565 ක භික්ෂූන් වහන්සේලාට සුවධරණී කැපකරු වෛද්‍ය සේවා සැපයීමට ආරම්භ කළ ව්‍යාපෘතියක කැපකරු වෛද්‍යවරුන් ලෙස පත්කිරීමට අපේක්ෂිත පාරම්පරික වෛද්‍යවරුන් වෙත ලබාදීම සඳහා රු.2,900,000 ක් වැයකර ඖෂධ රැගෙන යන ගමන් මළු 1,000 ක් මිලදී ගෙන තිබුණි. ආරණ්‍ය සංඛ්‍යාවට සාපේක්ෂව පත්කළ හැකි උපරිම කැපකරු වෛද්‍යවරුන් සංඛ්‍යාව 565 ක් වන බැවින් වැඩිපුර ගමන් මළු 435 ක් මිලදී ගැනීම සඳහා රු.1,261,500 ක් වැය කර තිබුණු අතර එය නිෂ්කාර්ය වියදමක් ලෙස නිරීක්ෂණය විය. තවද, 2022 අප්‍රේල් 08 දින වන විටත් ගම්පහ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ 13 ක පාරම්පරික වෛද්‍යවරුන් 105 දෙනෙකුට පමණක් ගමන් මළු බෙදාදී තිබුණු බවත්, එදිනට ගමන් මළු 895 ක් ඉතිරිවී තිබුණු බවත්, කැළණිය රජමහා විහාරයේදී පවත්වා තිබුණු බෙදාහැරීමේ උත්සවය සඳහා රු.223,300 ක් වැයකර තිබුණු බවත්, ගමන් මළු 1,000 මිලදී ගැනීම සහ ඒවා නිකුත් කිරීම පිළිබඳ දත්ත හා තොරතුරු තොග පොත්වලට ඇතුළත් කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය. | සුවධරණී කැපකරු සුවසේවා වැඩසටහන ඉදිරියේදී සියළුම පළාත්වල ක්‍රියාත්මක කරන බව, වයඹ පළාතේ වෛද්‍යවරු 58 දෙනෙකු ලියාපදිංචි කර වැඩසටහන ආරම්භ කර ඇති බව, 2022 වර්ෂය තුළ වැඩසටහන් ආරම්භ කිරීමට සමගාමීව බෑගය නිකුත් කරන බව, වැඩසටහන නිල වශයෙන් හඳුන්වාදීම, පුහුණුව ලබාදීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන 2021 දෙසැම්බර් 11 දින සිදු කළ බව, ආයුර්වේද සංරක්ෂණ සභාවල පාරම්පරික දේශීය වෛද්‍යවරුන්, ප්‍රජා සෞඛ්‍ය වෛද්‍ය නිලධාරීන් සහ සංවර්ධන නිලධාරීන් (දේශීය වෛද්‍ය) ඇතුළු 200 ක් පමණ පිරිසක් සහභාගී වූ බව හා සංග්‍රහ වියදම්, වැඩසටහන සඳහා අවශ්‍ය මූලික වියදම් සහ වෛද්‍යවරුන් 105 දෙනෙකු සඳහා රු.500 බැගින් රු.52,000 ක ගමන් වියදම් වෙනුවෙන් රු.221,300 ක් වැයකර ඇති බව. | ව්‍යාපෘතියක් ආරම්භ කිරිමට අවශ්‍ය මූලික කටයුතු සිදු කිරීමෙන් පසුව එය ක්‍රියාත්මක කිරීමේ එක් එක් අධියරවල අවශ්‍යතා අනුව සැලසුම් සහගතව මිලදී ගැනීම් සිදු කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | දිස්ත්‍රික්ක 09 ක ආයුර්වේද සංරක්ෂක සභා සඳහා පුස්තකාල පොත් ලබාදීමට රු.255,000 ක් වැයකර තිබුණු අතර ඉන් සියයට 42 කටත් වඩා වැඩියෙන් ගම්පහ දිස්ත්‍රික්කයට ලබාදීමට කටයුතු කර තිබුණි. තවද එම ප්‍රතිපාදන උපයෝජනය කර පොත් මිලදී ගත් බව තහවුරු කර ගෙන නොතිබුණි. | සංරක්ෂණ සභාවලට අදාළ ප්‍රාදේශීය ලේකම්වරුන් වෙත ප්‍රතිපාදන සලසා මිලදී ගත් පොත්පත්වල ලේඛනය අමාත්‍යාංශය වෙත එවා ඇති බව, “සුවධරණී” ප්‍රජා සත්කාරක ජාතික වැඩසටහන යටතේ නියමු ව්‍යාපෘතිය ගම්පහ දිස්ත්‍රික්කයේ සිදු කිරීමට තීරණය කළ බව, මහජන ඉල්ලීම් වැඩි වශයෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළින් පැමිණ තිබීම හා මීට පෙර ගම්පහ දිස්ත්‍රික්කය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක නොවීමද සැලකිල්ලට ගෙන වැඩි ප්‍රතිශතයක් එම දිස්ත්‍රික්කයට ලබා දුන් බව. | අමාත්‍යාංශයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා දීප ව්‍යාප්ත සැලසුම් සකස් කර ඒ අනුව කටයුතු කළ යුතුය. |
| (ඇ) | මහජනතාව තුළ සෞඛ්‍යාරක්ෂිත දේශීය ආහාර භාවිතය ප්‍රචලිත කිරීම හා බෝ නොවන රෝගවලින් ජනතාව මුදාගැනීමේ අරමුණින් පෝෂදායී දේශීය ආහාර අලෙවි කිරීම සඳහා දිවයින පුරා පෝෂණ මන්දිර අලෙවිහල් ස්ථාපිත කිරීමේ වැඩසටහන වෙනුවෙන් 2020 සහ 2021 වර්ෂවලදී පිළිවෙලින් රු.1,800,000 ක හා රු.5,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. ඒ අනුව එම වර්ෂ දෙක තුළදී පිළිවෙලින් රු.1,676,763 ක් හා රු.4,848,633 ක් වශයෙන් එකතුව රු.6,525,396 ක් වැයකර තිබුණු අතර ඉන් රු.5,000,000 ක් හෙවත් සියයට 77ක්ම ගම්පහ දිස්ත්‍රික්කය වෙනුවෙන් වැයකර තිබුණි. තවද, 2021 දෙසැම්බර් 31 දින වන විට පෝෂණ මන්දිර 35 ක් ඉදිකර තිබුණු නමුත් ඒවා ක්‍රියාත්මක තත්වයේ පවතින්නේද සහ අරමුණ ඉටුවන්නේද යන්න පිළිබඳ කිසිදු පසු විපරමක් අමාත්‍යාංශ විසින් සිදුකර නොතිබුණි. | “සුව ධරණී” ප්‍රජා සත්කාරක ජාතික වැඩසටහන යටතේ නියමු ව්‍යාපෘතිය ගම්පහ දිස්ත්‍රික්කයේ සිදු කිරීමට තීරණය කර තිබුණු බව, “සුව ධරණී” සුව චර්යා වැඩ සටහනට අනුව ප්‍රමුඛත්වය බස්නාහිර පළාතට ලබාදුන් බව, මහජන ඉල්ලීම් වැඩිවශයෙන් ගම්පහ දිස්ත්‍රික්කය තුළින් පැමිණි බව, ජනගහනය අධිකවීම හා කාර්යය බහුලත්වය නිසා ප්‍රශස්ථ පෝෂණ රටාවෙන් අපගමනය වීමෙන් විවිධ පෝෂණ තත්වයන් වාර්තාවූ බව, ඒ හේතුවෙන් ගම්පහ දිස්ත්‍රික්කය සඳහා වැඩි වශයෙන් පෝෂණ මන්දිර අලෙවිසැල් ලබා දුන් බව, 2021 දෙසැම්බර් 31 දින වන විට පෝෂණ මන්දිර 35 ක් ඉදිකර ඇති අතර, එම පෝෂණ මන්දිර සම්බන්ධයෙන් පසුවිපරම් කිරීම සඳහා 2022 ජනවාරි 12 දින අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත ලිපි යවා ඇති බව. | -එම- |

4. තිරසර සංවර්ධන අරමුණු ළගා කර ගැනීම

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9, 11හා 11.2 වගන්ති ප්‍රකාරව, ආයතනයේ අරමුණු ළඟාකර ගැනීම උදෙසා සිය සම්පත් කාර්යක්ෂමව මෙහෙයවිය යුතු අතර තිරසර සංවර්ධන අරමුණු ලඟාකර ගැනීම පිණිස ආයතනය විසින් සපුරාගත යුතු ඉලක්කයන් හා එම ඉලක්කයන් සපුරා ගැනීම සඳහා පවතින පරතරයන්ද, ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු දර්ශකයන්ද හඳුනාගත යුතුය. නමුත් අමාත්‍යාංශය විසින් එවැනි දර්ශකයන් හඳුනාගෙන අරමුණුවලින් ලඟාකරගත් ප්‍රමාණය හා බැහැරවීම් මෙන්ම අවධානය යොමු කළ යුතු විවිධ ක්ෂේත්‍රයන් හඳුනාගෙන නොතිබුණි. | අදහස් ඉදිරිපත් කර නොතිබුණි. | 2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනතේ 3.6, 3.9, 11 හා11.2 වගන්ති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

5. යහපාලනය

5.1 අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම පිණිස සුදුසු විගණකවරයෙකු පත්කර නොතිබුණි. | මෙම තනතුර සඳහා ශ්‍රී ලංකා ගණකාධිකාරී සේවයේ නිලධාරියෙකු පත් කර දෙන ලෙස රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇති බව, නිලධාරී හිඟය නිසා මෙතෙක් පත් කිරීමක් සිදු කර නොමැති බව හා 2022 වර්ෂයේ අභ්‍යන්තර විගණනයට අදාළව විෂය භාර නිලධාරියෙකු ලෙස සංවර්ධන නිලධාරියෙකු පත් කර ඇති බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 (1) වගන්තියේ සඳහන් විධිවිධාන අනුගමනය කළ යුතුය. |

6. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) 2021 දෙසැම්බර් 31 දිනට රාජ්‍ය අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය 403 ක් වුවද, එදිනට තථ්‍ය කාර්යය මණ්ඩලය 345 ක් වූයෙන් අනුමත කාර්යය මණ්ඩලයෙන් සියයට 14 කට සමාන පුරප්පාඩු සංඛ්‍යාව 58 ක් විය. | 90 ක්ව පැවති පුරප්පාඩු සංඛ්‍යාව දැනට 58 ක් දක්වා අඩු වී ඇති බව, අමාත්‍යාංශයේ සියළුම තනතුරු සඳහා කාර්ය මණ්ඩල අනුයුක්ත කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය වන බැවින් පුරප්පාඩු සම්පූර්ණ කර දෙන | කාර්යසාධන ඉලක්ක ප්‍රශස්ත මට්ටමින් ඉටුකර ගැනීමට අවශ්‍ය මානව සම්පත් සම්බන්ධයෙන් නැවත සමාලෝචනයක් |

| | | | |
|---|---|---|---|
| | තනතුරු 58 ක් පුරප්පාඩුව පැවතීම තුළින් රාජ්‍ය අමාත්‍යාංශයේ කාර්යසාධන ඉලක්ක ළඟාකර ගැනීම කෙරෙහි බලපෑමක් සිදුවිය හැකි බව නිරීක්ෂණය විය. | ලෙස අවස්ථාවන් කිහිපයකදීම ඉල්ලීම් කර ඇති බව හා නිලධාරී හිඟය නිසා මෙතෙක් නිලධාරීන් අනුයුක්ත කර නොමැති බව. | සිදුකළ යුතුය. |
| (ආ) | අනුමත කාර්යමණ්ඩලයට ඇතුළත්ව නොතිබුණු කම්කරු තනතුරක් සඳහා 2010 ඔක්තෝබර් මාසයේ සිට විශ්‍රාම වැටුප් සහිත ස්ථිර පදනම මත සේවකයෙකු බඳවාගෙන තිබුණු අතර සමාලෝචිත වර්ෂය වන විටත් තනතුර අනුමතවී නොතිබුණි. | ඉහළ බලධාරීන් වෙත මෙම ගැටළුව ඉදිරිපත් කර අනුමැතිය අපේක්ෂා කළද ඒ සඳහා සාධනීය පිළිතුරු ලැබී නොමැති බව, මොහු දැනට අමාත්‍යාංශයේ පවතින පුරප්පාඩුවක් සඳහා අනුයුක්ත කොට සේවය ස්ථිර කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගැනීමට කටයුතු කරමින් පවතින බව. | නීත්‍යානුකූල නොවන ආකාරයට බඳවා ගැනීම් සිදු නොකළ යුතුය. මෙවැනි අනීතික පත්වීම් ඉදිරියේදී සිදු නොවීම සඳහා සුදුසු පාලන ක්‍රම ස්ථාපිත කළ යුතුය. |
| (ඇ) | රාජ්‍ය අමාත්‍යාංශයේ සේවයේ නියුක්ත නොවූ කාර්යාල කාර්ය සහායකයෙකු වෙත 2021 මාර්තු මාසයේ සිට 2021 දෙසැම්බර් මාසය දක්වා කාලය තුළදී සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් ගෙවා තිබුණු එකතුව රු.394,690 ක්වූ වැටුප් හා දීමනා රාජ්‍ය අමාත්‍යාංශය විසින් ප්‍රතිපූර්ණය කර තිබුණි. | මෙම අමාත්‍යාංශයේ අමාත්‍ය කාර්යාලයේ අවශ්‍යතාව මත, මෙම අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව ඇතුළත මෙම සේවකයා අනුයුක්ත කර ඇති බව, වැටුප් හා දීමනා ගෙවීම සඳහා එම මුදල ප්‍රතිපූර්ණය කර ඇති බව හා 2022 මැයි 18 දින මෙම සේවකයා නැවත සෞඛ්‍ය අමාත්‍යාංශය වෙත මුදා හැර ඇති බව. | නිසි අනුමැතියකින් තොරව අක්‍රමවත් තීරණ මත නිලධාරීන් අනුයුක්ත කිරීම හා වැටුප් ප්‍රතිපූර්ණය කිරීම සිදු නොකළ යුතුය. |
| (ඈ) | 2019 මැයි 15 දින සිට පරිපාලන නිලධාරී තනතුර පුරප්පාඩුව පැවතියද, එම තනතුර සඳහා ස්ථිර නිලධාරියෙකු බඳවා නොගෙන 2020 නොවැම්බර් 09 සිට කොන්ත්‍රාත් පදනම මත විශ්‍රාමික නිලධාරියෙකු බඳවා ගෙන තිබුණි. | කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් මෙම අමාත්‍යාංශයේ පරිපාලන නිලධාරී තනතුර රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ තනතුරක් ලෙස අනුමත කර ඇති බව හා රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි ශ්‍රේණියේ නිලධාරීන් ප්‍රමාණවත් සංඛ්‍යාවක් නොමැති බැවින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සෞඛ්‍ය සේවා කමිටුවේ අනුමැතිය මත විශ්‍රාමික රාජ්‍ය සෞඛ්‍ය කළමනාකරණ සහකාර සේවයේ නිලධාරිනියක් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යොදවා ඇති බව. | කාර්යසාධන ඉලක්ක ප්‍රශස්ත මට්ටමින් ඉටුකර ගැනීමට අවශ්‍ය මානව සම්පත් සම්බන්ධයෙන් නැවත සමාලෝචනයක් සිදුකළ යුතුය. |